**කලාප සමාජ විද්‍යා තරගාවලිය- 2024**

**11 ශ්‍රේණිය**

කාලය: පැය 02යි.

නම:.......................................................................................................................................

පාසල:.....................................................................................................................................

පාසල් වර්ගය : 200අඩු/ 201- 500/ 501-1000/ 1000 වැඩි (අදාල කාණ්ඩය යටින් ඉරක් අදින්න. )

| උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි. | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1-10 | |
| 11-15 | |
| 16-20 | |
| 21-25 | |
| 26-30 | |
| 31-35 | |
| 36-45 | |
| එකතුව | |
| පළමු පරීක්ෂක අත්සන | |
| දෙවන පරීක්ෂක අත්සන | |

- සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
  - අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

1. ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූයේ,

   i. තෝමස් මෙට්ලන්ඩ් ii. ෆ්‍රෙඩ්රික් නෝර්ත් iii. රොබට් බ්‍රවුන්රිග් iv. ජෝන් ඩොයිලි

2. ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගත් අවධියේ උඩරට පාලකයා කවුරුන්ද?

   i. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ii. කීර්ති ශ්‍රී රාජසිංහ රජු iii. රාජාධි රාජසිංහ රජු iv. ශ්‍රී විජය රාජසිංහ රජු

3. සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක පමණක් ඇති පිළිතුර තෝරන්න.

   i. බදුල්ල, මොණරාගල ii. මොණරාගල, රත්නපුරය iii.කෑගල්ල, බදුල්ල iv. කෑගල්ල, රත්නපුරය

4. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්යය සංවර්ධන යෝජනා ක්‍රමය හා සම්බන්ධ ගංගාව කුමක්ද?

   i. ගල්ඔය ii. මහවැලි iii. වලවේ iv. නිල්වලා.

5. කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල ජලාශ ඉදිකිරීම සඳහා ආධාර ලබා දුන් රටවල් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ස්වීඩනය, නැගෙනහිර ජර්මනිය, කියුබාව ii. ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, බටහිර ජර්මනිය.
iii. ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය. iv. මහා බ්‍රිතාන්‍ය, බටහිර ජර්මනිය, ස්වීඩනය

❖ අංක 6 සිට 10 තෙක් දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6. පෙනී තැපැල් සේවය යනු;
i. ස්ථාන දෙකක් අතර කම්බියක් යොදා සංකේත මගින් පණිවිඩ යැවීමයි.
ii. එංගලන්තයේ ඕනෑම තැනකට පැන්සයක් ගෙවා ලිපියක් යැවීමට හැකිවීමයි.
iii. ඕනෑම රටකට පැන්සයක් ගෙවා ලිපියක් යැවීමට හැකිවීමයි.
iv. අඩු වියදමකින් ලිපියක් හුවමාරු කරගැනීමයි.

7. කාර්මික විප්ලවයේදී යන්ත්‍ර සූත්‍ර නිපදවීම සඳහා දැනුම ලැබීමට හේතු වූයේ;
i. කර්මාන්ත ශාලාවල සේවයට අවශ්‍ය මිනිස් ශ්‍රමය අඩුවීමයි.
ii. යන්ත්‍ර සූත්‍ර තැනීම සඳහා අවශ්‍ය යකඩ හා වානේ තිබීමයි.
iii. 14 හා15 වන සියවස්වලදී යුරෝපයේ ඇතිවූ පුනරුදයයි.
iv. ජනගහන වර්ධනය අධික වීමයි.

8. ගෝලීය ජල ව්‍යාප්තිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ;
i. ඇළ, දොළ, ගංගා හා විල්වල ඇති ජලය භූගත ජලය ලෙස හැඳින්වේ.
ii. ජල ගෝලයේ අඩංගු ජලය ඝන, ද්‍රව, වායු යන ස්වභාවයන් තුනෙන්ම පවතී.
iii. ප්‍රධාන සාගර හතක් දක්නට ලැබේ.
iv. පෘථිවි තලයෙන් 97%ක් වැසී ඇත්තේ ජලයෙනි.

9. හුණුගල් ආශ්‍රිත භූ ව්‍යුහයක් පැවතීම නිසා යාපන අර්ධද්වීපයේ වැඩි කොටසක
i. අධික වියළි දේශගුණයක් ඇත. ii. සාරවත් පසක් නිර්මාණය වී ඇත.
iii. වර්ෂය පුරා ජල හිඟයක් පවතී. iv. මතුපිට ජලවහන රටාවක් දක්නට නැත.

10. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
i. විධායක ජනාධිපති ධූරයක් ඇති කිරීම. ii. අධිකරණ සේවා කොමිසම පිහිටුවීම.
iii. මූලික අයිතිවාසිකම් ප්‍රකාශයක් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම. iv. ඔම්බුඩ්ස්මන් ධූරයක් ඇති කිරීම.

(ලකුණු 1x10)

❖ 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

11. 1800 වර්ෂයේදී දූතයකු ලෙසත්, 1803 දී උඩරට ආක්‍රමණය මෙහෙයවීමත් සිදුකරන ලද්දේ .................................................................. සෙනෙවියා විසිනි.

12. ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය................................................................................... නීතියයි.

13. 1832 වර්ෂයේදී චර්ච් මිෂනාරී සංවිධානය විසින් ................................................................ ප්‍රකාශය එළිදක්වන ලදී.

14. පැසිපික් සාගරය ................................ ඇල මාර්ගය මගින් අත්ලාන්තික් සාගරය හා සම්බන්ධ වෙයි.

15. 2024 එක්සත් ආරාබි එමීර් රාජ්‍යයේ පැවැත්වූ 21 වැනි ආසියානු කනිෂ්ඨ මළල ක්‍රීඩා තරගයේ තුන් පිම්ම කාන්තා ඉසව්වෙන් ........................................................................................ රිදී පදක්කමක් ජයග්‍රහණය කළාය. (ලකුණු 2x5)

❖ අංක 16 සිට 25 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

16. මෙරට ප්‍රථම මුද්‍රණාලය වූ ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය ආරම්භ කිරීමට පුරෝගාමී වූ භික්ෂූන් වහන්සේ කවුද? ..........................................................................................................

17. පසුගියදා කොළඹදී විවෘත කරන ලද දකුණු ආසියාවේ ප්‍රථම අහස් පාලමින් යුතු අති සුඛෝපභෝගී හෝටල් ව්‍යාපෘතිය කුමක්ද? ...............................................................................

18. වර්තමාන ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ නායිකාව නම් කරන්න.

......................................................................................................................................

19. මහනුවර නගරයේ නවීකරණ කටයුතුවල රාජකාරී සඳහා පැමිණි සබරගමුව, සත්කෝරලය සහ සතර කෝරලය වැනි ප්‍රදේශවල ජනතාවට රාත්‍රී කාලයේ අගනුවර නවාතැන් ගැනීම තහනම් කළ රජතුමා කවුද? ........................................................................................................................

20. මුස්ලිම් නීතියට අනුව නඩු විසඳීම සඳහා පිහිටුවනු ලැබූ උසාවි හඳුන්වන්නේ කෙසේද?

....................................................................................................................... (ලකුණු 2x5)

❖ 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

21.



i. යාබද රූපයෙන් දැක්වෙන්නේ කුමක්දැයි හඳුනාගෙන නම් කරන්න.

ii. මෙය පිහිටා ඇති ස්ථානය නම් කරන්න.

22.



i. රූපයේ දැක්වෙන හිමිනම නම් කරන්න.

ii. මෙම හිමියන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් වූයේ ඇයි?


23.




i. යාබද රූපයෙන් දැක්වෙන ලාංඡනයෙන් සංකේතවත් වන සංවිධානය කුමක්ද?

ii. එම සංවිධානයේ මූලික අරමුණක් සඳහන් කරන්න.

24.




i. යාබද සිතියමේ A-B ලෙස දැක්වෙන භූ විෂමතා ලක්ෂණය කුමක්ද?

ii. C-D ලෙස දැක්වෙන භූ විෂමතා ලක්ෂණය කුමක්ද?

25.



i. යාබද රූපයේ කොළ පසුබිමෙහි රතු දැක්වෙන ජාතික කොඩිය අයත් රට කුමක්ද?

ii. එම රටෙහි අගනුවර කුමක්ද?

(ලකුණු 2x5)

❖ ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට "අ" තීරුව "ආ" තීරුව යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

26.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. තේ | A. අම්බලන්තොට |
| 2. පැගිරි | B. කළුතර |
| 3. රබර් | C. බදුල්ල |
| 4. බුලත් | D. කටුගම්පොල |

i. ABCD ii. BACD iii. CABD iv. CBAD

27. “අ” තීරුව “ආ” තීරුව

| “අ” තීරුව | “ආ” තීරුව |
|---|---|
| 1. ජේම්ස් හාග්‍රිව්ස් | A. දුවන නඩාව |
| 2. ජෝන් කේ | B .රෝලර් යන්ත්‍රය |
| 3. රිචඩ් ආක්රයිට් | C. ජේනි යන්ත්‍රය |
| 4. හෙන්රි කෝට් | D. ජල රාමුව |

i. ABCD ii. ADBC iii. CDAB iv. CADB

28.

| “අ” තීරුව | “ආ” තීරුව |
|---|---|
| 1. ඛණිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය | A. ඔපෙක් |
| 2. අග්නිදිග ආසියාතික රටවල සංවිධානය | B. සාර්ක් |
| 3. දකුණු ආසියාතික සහයෝගීතා සංවිධානය | C. ලෝක බැංකුව |
| 4. ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව | D. ආසියන් |

i. ADBC ii. ABDC iii. BACD iv. DABC

29.

| “අ” තීරුව | “ආ” තීරුව |
|---|---|
| 1. වලවේ ගග | A. රාජාංගන ජලාශය |
| 2. කලා ඔය | B. ලුණුගම්වෙහෙර ව්‍යාපෘතිය |
| 3. යාන් ඔය | C. කොත්මලේ ව්‍යාපෘතිය |
| 4. මහවැලි ගඟ | D. හුරුලු වැව |

i. ABDC ii. BACD iii. B ADC iv. CABD

30.

| “අ” තීරුව | “ආ” තීරුව |
|---|---|
| 1. උඩරට ප්‍රථම නිදහස් අරගලය | A. 1796 |
| 2. මුහුදු බඩ පළාත් ඉංග්‍රීසීන්ට යටත් වීම | B. 1948 |
| 3. උඩරට රාජ්‍ය ඉංග්‍රීසීන්ට යටත් වීම | C. 1818 |
| 4. ලංකාවට නිදහස ලැබීම | D. 1815 |

i. ABCD ii. BACD iii. CADB iv. DABC (ලකුණු 2x5)

❖ අංක 31 සිට 35තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

31. i. ප්‍රංශ විප්ලවයෙන් පසු ප්‍රංශයේ බිහි වූ නව ආණ්ඩුව ඕලන්දය ආක්‍රමණය කරනු ලැබූ අවස්ථාවේ එහි සිටි පාලකයා නම් කරන්න.

ii. මදුරාසි පාලනය යටතේ ආදායම් එකතු කිරීම සඳහා පත්කරනු ලැබූ නිලධාරීන් දෙපිරිසක් නම් කරන්න.

iii. මියුරන් කොමිසමේ නිර්දේශ තුනක් සඳහන් කරන්න.

32. i. 1798-1802 දක්වා ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පැවති පාලන ක්‍රමය හඳුන්වන්නේ කෙසේද?

ii. 1798 රාජාධි රාජසිංහ රජුගේ අභාවය සිදුවන විට උඩරට සිංහාසනයට උරුමකම් කියූ කුමාරවරුන් දෙදෙනා නම් කරන්න.

iii. 1803 උඩරට ආක්‍රමණය කිරීමට ඉංග්‍රීසීන්ගේ අවධානය යොමුවීමට හේතු වූ කරුණු 3ක් සඳහන් කරන්න.

33. i. ලන්දේසීන් විසින් මෙරටට හඳුන්වා දුන් නීති ක්‍රමය හඳුන්වන්නේ කෙසේද?

ii.1973 යුක්තිය පසිඳලීමේ පනතට අනුව මෙරට පිහිටවනු ලැබූ අධිකරණ ආයතන දෙකක් නම් කරන්න.

iii. අධිකරණ අමාත්‍යවරයාට පැවරී ඇති අධිකරණ බලතල තුනක් නම් කරන්න.

34. i.ලෝක වාර්ෂික මිනිරන් නිෂ්පාදනයෙන් 60%ක් පමණ නිපදවන ආසියාතික රට කුමක්ද?

ii.පොළොවේ තැන්පත් වී ඇති ස්වභාවය අනුව මිනිරන් වර්ග දෙකක් නම් කරන්න.

iii.මිනිරන් වලින් ලබා ගන්නා ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

35. i.පසුගියදා ගුවන් අනතුරකින් මියගිය රාජ්‍ය නායකයා කවුද?

ii. ඔහු කුමන රටක, කුමන තනතුරක් දැරූ අයෙක්ද?

රට..........................................................................................................................

තනතුර......................................................................................................................

iii.ඔහු මෙරටදී පිළිගනු ලැබුවේ කුමන ගුවන්තොටුපලේදීද?

කවුරුන් විසින්ද?


ඔහු පැමිණියේ කුමන කටයුත්තක් සඳහාද?

(ලකුණු 6x5=30)

❖ අංක 36 සිට 45 තෙක් දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න.

| | |
|---|---|
| 36. ගම්පොළ | 37. පේදුරු තුඩුව |
| 38. මී ඔය | 39. පරාක්‍රම සමුද්‍රය |
| 40. මහා වාලුකා ගාම | 41. මහාතිත්ත |
| 42.ලංකා පටුන | 43. කිරිදිඔය |
| 44. වුන්ඩිකුලම් අභයභූමිය | 45. කතරගම |

(ලකුණු 2 x 10=20)




LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
O/L
2013 - 2022
ඉතිහාසය
සංගීතය
2024
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න